රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2020.05.06

අධ්‍යක්ෂ ප්‍රවෘත්ති,

ප්‍රවෘත්ති කර්තෘ,

**අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීම**

අද දින (2020 මැයි 06) රැස් වූ අමාත්‍ය මණ්ඩලය විසින් ගනුලැබූ තීරණ දැනුම් දීමේ ප්‍රවෘත්ති සාකච්ඡාව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේදී පැවැත්විණි. මේ සඳහා කැබිනට් ප්‍රකාශකවරුන් වන ගරු උසස් අධ්‍යාපන, තාක්ෂණ, නවෝත්පාදන සහ තොරතුරු හා ජනමාධ්‍ය අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන සහ ගරු වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍ය රමේෂ් පතිරණ යන මහත්වරුන් සහභාගි වූ අතර එහිදී ප්‍රකාශ කරන ලද කරුණු වල සංක්ෂිප්තයක් පහත දැක්වේ.

- කොරෝනා ව්‍යසනය නිසා පීඩාවට පත් ජනතාවට සහන සැලසීමේ රජයේ වැඩසටහන යටතේ රු.5000 දීමනාව පුද්ගලයන් ලක්ෂ 74 කට පමණ මේ වනවිට ලබා දී තිබේ. මෙම අසීරු කාලවකවානුව තුළ මෙම සහන සැලසීමේ ක්‍රියාවලියට සක්‍රියව දායකවූ ග්‍රාමීය කමිටු වල සාමාජිකයින් වන රාජ්‍ය නිලධාරීන් විසින් දරන ලද ඉන්ධන, දුරකථන හා වෙනත් අත්‍යවශ්‍ය වියදම් වෙනුවෙන් විශේෂ දීමනාවක් ගෙවීමට තීරණය කිරීම.

- ආතර් සී.ක්ලාක් මධ්‍යස්ථානය යටතේ මේ වන විට ලාංකීය විද්‍යාඥයින් විසින් ගුවන්ගත කර ඇති සඳ මත ඡායාරූප ගැනීමේ උපකරණ මගින් දෛනිකව ඡායාරූප හා දත්ත ලබාගනු ලැබේ. මෙම දත්ත පාදක කරගනිමින් වඩාත් නවීන තාක්ෂණය භාවිතයෙන් **භූමිව නිරීක්ෂණ චන්ද්‍රිකා දත්ත ප්‍රතිග්‍රහණය කිරීමේ හා බෙදාහැරීමේ මධ්‍යස්ථානයක්** හෝමාගම, තලගල ප්‍රදේශයේ ප්‍රතිෂ්ඨාපනය කිරීම.

- රුහුණු විශ්ව විද්‍යාලයේ මහල් 12 කින් යුතු වෛද්‍ය පීඨ ගොඩනැගිලි සංකීර්ණයේ කොන්ත්‍රාත් කාලය අවසන්ව එම ඉදිකිරීම් නතර වී ඇති අතර මධ්‍යම ඉංජිනේරු කාර්යාංශය මගින් එහි ඉදිකිරීම් නැවත ආරම්භ කිරීම.

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை எவனியூ, கொழும்பு 05, இலங்கை.
දු.අ. / t (+94 11) 2515759
ෆැ. / f (+94 11) 2514753
www.news.lk

- විශ්ව විද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන සිසුන් මෙන්ම වෘත්තිකයින්ද කොළඹ නගරය ආශ්‍රිත පෙදෙස් වල නේවාසිකව සිය කටයුතු කරනු ලැබේ. ඔවුන්ගෙන් හා වෙළඳසැල් ආදිය කුලියට ලබාගෙන ඇති පුද්ගලයින්ගෙන් මෙම කොවිඩ් 19 කාලය තුළ දී මාසික කුලියෙන් අඩක් පමණක් අය කරන මෙන් රජය විසින් නේවාසික කාමර හිමියන් හා කඩහිමියන් වෙත ඉල්ලීමක් කරනු ලැබේ.

- රජය සතු ව්‍යවසායන් මෙම උවදුරු කාලසීමාව තුළ මූල්‍ය අර්බුදයන්ට ලක්ව ඇති අතර සේවක වැටුප් ගෙවීම ආදිය සම්බන්ධයෙන්ද ගැටලුවලට මුහුණ පා ඇත. ඒ අනුව උදා.වශයෙන් සතොස ආයතනය, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වැනි රාජ්‍ය ව්‍යවසාය ආයතන සඳහා මූල්‍ය පහසුකම් ලබාදීම.

- රජය විසින් මේ වන විටත් විදෙස්ගත ශිෂ්‍යයින් බොහෝ දෙනෙක් මෙරටට ගෙන්වා නිරෝධායනයට යොමු කර ඇත. ප්‍රමුඛතා ලේඛනයකට අනුව ක්‍රියාත්මක වන මෙම කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර විදෙස්ගත ශ්‍රමිකයින්ද ගෙන්වා ගැනීමට ක්‍රමයෙන් ක්‍රියාත්මක වනු ලැබේ.

  මීළඟ පියවර වශයෙන් මැදපෙරදිග කලාපයේ ශ්‍රමිකයින් ගෙන්වා ගැනීමට කටයුතු කරන අතර ප්‍රථමයෙන් කුවේට්, මාලදිවයින හා ඩුබායි රටවල සිටින ශ්‍රී ලංකාවට පැමිණීමට අවශ්‍ය බව ප්‍රකාශ කළ තැනැත්තන් ගෙන්වා ගැනීමට අපේක්ෂිතය.

  ඒ අනුව, විදෙස්ගතව සිටින ශ්‍රී ලංකාවට පැමිණිය යුතු බව ප්‍රකාශ කරන ලාංකිකයින් ඉඩ ප්‍රස්ථා ලැබෙන පරිදි ක්‍රමිකව ගෙන්වාගෙන නිරෝධායනයට යොමු කිරීමට කටයුතු කරනු ඇත.

- දකුණු අප්‍රිකානු හිටපු ජනාධිපතිවරයකු වන නෙල්සන් මැන්ඩෙලා මැතිතුමන්ට උපහාර පිණිස ඔහුගේ පිළිරුවක් ඉදිකිරීම සඳහා කොළඹ නාගරික පුස්තකාල පරිශ්‍රයට අයත් ඉඩමෙන් ඉඩ පහසුකම් ලබාදීම. මේ සඳහා රජයේ ප්‍රතිපාදන වැය නොකෙරේ.

  එමෙන්ම, ඉදිරියේදී ජාතික වීරුවන් හා බුහුමනට ලක්විය යුතු තැනැත්තන්ට උපහාර පිණිස විවිධ ස්ථානයන්හි පිළිරු, ස්මාරක ප්‍රතිශ්ඨාපනය වෙනුවට එක් විශේෂිත ස්ථානයක එම ප්‍රතිමාවන් ඉදිකර බුහුමන් දැක්වීමට වැඩපිළිවෙලක් සකස් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

- කරාපිටිය පිළිකා ප්‍රතිකාර ඒකකය වෙනුවෙන් මහල් දහයකින් යුතු ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමට කටයුතු සංවිධානය කර තිබුණත් එහි වැඩකටයුතු ආරම්භ වී නොතිබුණි. මේ සඳහා රජය විසින් 2020 -2021 අයවැය මගින් මිලියන 500 ක් වෙන් කිරීමට තීරණය කරන ලද අතර එම ප්‍රතිපාදන ලැබෙන තෙක් මේ සඳහා විශේෂ දායකත්වයක් ලබා දෙන Colours of Courage ආයතනය විසින් රැස්කළ මිලියන 750 ක මුදලින් ඉදිකිරීම් ඇරඹීමට තීරණය විය.

- ගාල්ලේ ඉදිකෙරෙන දකුණු ආසියාවෙන්ම විශාලතම මාතෘ රෝහල වන "හෙල්මුද් කෝල්" මාතෘ රෝහලේ ඉදිකිරීම් කටයුතු වලට අදාළව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම.

- ශ්‍රී ලංකාව හා චීන සංවර්ධන බැංකුව අතර ණය ලබාගැනීමේ වැඩසටහන මගින් බිලියන 15 ක පිරිවැයක් දරමින් මාර්ග කිලෝමීටර 105 ක් වැඩිදියුණු කිරීම.

මෙහි සම්පූර්ණ වීඩියෝ පටය හා හඬපටය පහත සඳහන් ලින්ක් එක ඔස්සේ ලබා ගත හැකිය.

https://www.vishmithacloud.com/s-KKfd5plm